


අතුල කල්දමුල්ල ලියයි

# මළවුනට ගෞරවයෙනි

කාලය ගෙවීයයි. අතීත සුන්දරත්වය අදටද මෙනෙහි කරමින් යන ගමනේ විටෙක දුකේද විටෙක සතුටක්ද ගෙන එයි. දුක සතුට අතර දෝලනය වන සිතිවිලි අතීත සැමරුම් කරා ගෙනයන්නේ හමුවීම් , කතා බහ, විවිධ වූ චරිත අතරටයි.

මා ආදරණීයන් වන කලාවේ අගතැන්ගත් සහෘදයන් කිහිප දෙනෙකුම ජීවන රඟ මඩල හැර ගොසිනි. එනමුදු ඒ ගුණසුවඳ අදටද අප අතර ජීවත්වෙති.

මා රැකියාව තුල වෙළඳ ප්‍රචාරකායතනයෙන් යම් වෙලාවක් ලැබුන විටදී ගුවන්විදුලියේ පිටපත් කියවන්නෙකු ලෙස සහභාගී වීමට අවස්ථාව සලසා දුන්නෙ බන්දුල සමන් චතුරේගම හිතවතාය.ඔහු එවකට ගුවන්විදුලියේ වැඩසටහන් නිශ්පාදක වරෙයෙකු හා ක්‍රීඩා විචාරක තනතුරද හෙබවූයේය.

සරස්වති මණ්ඩපය, විද්‍යා සංග්‍රහයන් වැනි වැඩසටහන් කිහිපයකටම ඔහු මා සහභාගී කරගත්තේය. ගුණරත්න අබේසේකරයන්, දොස්තර නන්දදාස කෝදාගොඩ, තුසිත මලලසේකර, මර්වින් සේනාරත්නයන් වැනි ප්‍රවීනයන් ගේ ගුවන් විදුලි වැඩ සටහන්වල පිටපත් කියවන්නට බන්දුල දුන් අතහිත අදටද විශේෂ වූ ස්තුතිය මා ඔහුට පුදකරමි.

වැඩසටහන් වලට සහභාගිවන අතරතුර බන්ඩුල මට ගුවන්විදුලියේ ප්‍රවීනයන් හඳුන්වා දුන්නේය.

''සත් සමුදුර'' වැනි සිනමා කෘතිවල සංගීතඥ ප්‍රවීණවූ සෝමදාස ඇල්විටිගල ගුවන්විදුලි නිවේදක වැඩසටහන් නිශ්පාදක ප්‍රේමනාත් ජයතිලක වැන්නවුන්ද, ගුවන්විදුලි සංගීත අංශයේ සියල්ලන්ද බන්දුලයන් මට මුනගැසීමට උපකාර කලේය. ඔවුන්ගේ අවංක වූ අදහස් උපදෙස් අදටද මට සතුටක් ගෙනදෙයි.

වැඩසටහනකට සහභාගී වී එලියට එන අවස්ථාවේදී ලඟි ලඟියේ රූපවාහිනිය දෙසට ගමන් කරන ආදරනීයකු මුන ගැසේ.

"ප්‍රේම් අයියා මොකද මේ කලබලේ" ඔන්න කාලයක් බලාඋන්න අපේ මිත්‍රයා ඔයා එක්ක කතා කරන්න. බන්දුල ප්‍රේම් අයියගෙ ගමනේ සැර බාලකොට නවත්තාගනී.

''ශනිදා සාදය'' වැඩසටහනේ පෙනෙන මුවපුරා නැගෙන සිනාව, ඒ අතරට නල දතද හොඳින් දිස්වේ.

"ආහ් බන්දු... මට කිව්වෙ මේ මල්ලි ගැනද? මල්ලි අපි හෙට අනිද්දම හම්බෙමු.අද මේ දුවන්නෙ හදිසි නැති හදිසියකට..අපි වෙලාවක් හදාගමුකෝ...ඔහු නික්ම ගියේ බලාපොරොත්තු රඳවමිනි."හෙට අනිද්දම හම්බවෙමු.. ඒ වචන ටික අදටත් මසිත රැව්පිලිරැව් දේ.ස්නේහවන්තව පිට වූ ඒ වචන පෙල අසන්නට ලැබෙන්නේ කවදාද? අවාසනාවක මහත.ඉන් දින කීපයකට පසු ප්‍රේමකීර්තිද අල්විස් නම්වූ ආදරනීයයා ජාතික වස්තුව අපහැර ගියේය.හැර ගියා නොව "අප අතරින් සදහටම වෙන් කළේය".

වැඩ.. වැඩ... පොඩි විවේකයක් එපැයෑ.අද මොකද කරන්නේ.එනවා යන්න හවස මාත් එක්ක.පොඩි එකක් අරගෙන කයියක් ගහන්න..සුරේගේ හඬින් අවදිවෙමි.

මා සමඟ ප්‍රචාරකායනතනයේ වැඩකල සුරේ ගැන කියන්නට ඔහුගේ දක්ෂකම් කියවන්නට බොහෝ අය වෙති.එවකට ලාබාලයෙකු වූ මාහට මෙවැනි ප්‍රසාදනීය ප්‍රවීණයෙකු ඇසුරුකිරීම ගැන මාහට ආඩම්බරයක් ගෙනදේ. අප ආයතනයේ නිර්මාණශීලි පිටපත් රචකයෙකු ලෙස සේවයේ කලේ ඔහුගේ නිර්මාණ කලා කටයුතු අතරතුරය. විවිධ තනතුරු හෙබවූ සුරේ වේදිකාව, චිත්‍රපට, ටෙලි නාට්‍ය අතර ප්‍රවීන නළුවකු සේම පුවත්පත් කලාව, නිර්මාණශීලි පිටපත් රචනය ගැන සම්මානයට පාත්‍ර වූ දක්ෂයෙකු වූයේය.

ඔහුගේ නිර්මාණ අතරට සිනමා ''හංසවිලට-'' කැලතු අපූරු චචන කාණ්ඩයකින් එක රැයකින් ජනතා ප්‍රසාදය දිනාගත්තේය.

"තමුසෙ බලනවා තමුසෙගේ දේවාලේ දෙයියෝ වැඩ ඉන්නවද".. කියලා චන්දුවගේ එක් රූප රාමුවක සුරේ දොරගුලු කරන්නේ චිත්‍රපටයේ ප්‍රධාන චරිතයක් වූ ධර්මසිරි බණ්ඩාරනායකට උපහාසාත්මක වචන පෙළකින් සංග්‍රහ කරමිනි. ''හංසවිලක්'' කැලතූ මේව අපූරු හිතවතා බලදේවගේ පියාණන්, සුදු නෝනේ ගේ ස්වාමියා වීරසේකර වන්නේ යශෝරාවය ටෙලිවෘතාන්තයෙන්ය.

වැඩ කරන අතරතුරේ වෙලාවක් ලද සැනින් වහා ඔහුගේ මේසය ඉදිරිපස පුටුවේ හිඳ තොරතුරු විමසීම මගේ එක් අංගයකි.මා හා බොහෝ කුළුපගවූ ඔහු අවසමාවක් ලැබෙන මොහොතකදී නිර්මාන පිලිබඳව අදහස් දක්වන්නට ඒවා පිලිබඳව උපදෙස් දෙන්නටද කාරුණික විය.

ඔහු කවදාවත්ම යතුරු පැදියකට ගොඩවී ගමනක් යන්නට කැමත්තක් දැක්වූයේ නැත.යන ගමනක් කාර්යාලයේ වාහනයක් හෝ කුලීරථය ගෙන්වා ගැනීමට පුරුදුව සිටියේය.

පෙර කී පරිදි මා මගේ හිතවතාගෙ ඇරයුමට එකඟ වීමි.ඒ සවස් සාමයේ ඔහු හා පිලිසඳරකට එකතුවීම සඳහා අවන්හලකට එන ආරාධනාවටයි. යටි සිතින් යම්කිසි ප්‍රමෝදයක් මට දැනෙි. අද දවස සුරේ එක්ක තව කීපදෙනෙක් හමුවේවි. අඳුනගන්න,රසකතා අහන්නත් පුලුවන් වේවි.වහා පණගැන්වූ යමහා SR 125 අශ්වයා තවත් හිස්වැසුමක්ද රැගෙන සුරේට මා සමඟම යමු යැයි බල කලෙමි.

''මෙන්න මේ එඩ්ස් එකට එනවා.'' මට ඕකේ ගිහින් බෙල්ල කඩාගන්න බෑ. මම ඔෆිස් වාහනේ එන්නම්.

කෙසේ හෝ මා ඔහුට පෙර බම්බලපිටිය තුම්මුල්ල හන්දියට ඔබ්බෙන් වූ "මලින්කා" අවන්හලට ගොස් රැඳී සිටිමි.එතැන කලාකරුවන් කිහිප පෙළක් එකිනෙක කතා-බහේ යෙදෙමින් , අයෙකු බීර විදුරුවක, සැර පානයක් තොල ගාමින් කට හඬ අවදි වේ. එනමුත් වෙන අවන්හල් පරිදි ටවුන් හෝල් එකේ ගිරවුන්ගේ ඝෝෂාව වැනි ස්වරූපයක් නොගත්තේය. මගේ හිත-වතාගෙ පැමිණීමත් සමගම හිතේ උද්දාමය පිරුණු මනසින්ම හරි බරි ගැසී අසුනට බර දුනිමි.''තමුසෙ විදිල්ලක් වගේ ආවනේ. ට්‍රැෆික් එකේ මම ආවෙ.එකත් එකටම බස් හෝල්ට් අස්සෙනුත් දාගෙන එන්නැති'' සිරිත් පරිදි නළලත රැඳුනු කණ්-ණාඩිය මදක් ඇඟිල්ලෙන් ඔසවා සිනාමුසු මුහුණෙන් පිලිතුරු දෙයි.සුරේත් මාත් කතා බහ අතර මොහොතකින් අවන්හල ඉදිරිප්ට මිට්ශුබිෂි කොට මොඩ්ල් වර්ගයේ ජිප් රථයක් නැවැත්වුනි. එයින් බැසගත් පරිනත බව පිළිබිඹු කරන දේහධාරී පුද්ගලයෙකු කෙලින්ම චිත් අසුන් ගන්නෙ සුරේට අසලවූ පුටුවේය.

"තමුසේ එනව කියලා කිව්වනේ...මටත් හිතුනා එන්න..කව්ද මේ තරුණයා....ඔහු සුරේගෙන් විමසයි.

ආ...මේ අපේ වැඩකරන තැන ආර්ට්ඩිරෙක්ටර් කෙනෙක්. ඔහුට මාව හඳුන්වාදුනි. මා පළමුවරට ටයි මහත්තයා අඳුනගත්තේ එදාය. අවට වූවන් ගේ ගරුසරුව ටයි මහත්තයාට නිබඳවම ලැබුනි. රූපවාහිනියේ අංශ ප්‍රධානියෙකු වූ ටයි මහත්තයා කෙලින් කතා කරන විවිධ වූ විෂයන් පිලිබඳව මනා දැනමුත්තෙකු වීමත් ඔහුව හඳුනා ගැනීමත් අදටද මහත් ආඩම්බරයකි.

තවත් මොහොතකදී ගුවන් විදුලියේ ප්‍රධානියා අවන්හලට ගොඩ වැදුනේය... ''අයියේ තමුසෙ කොහෙද මෙහෙ.ඇරත් මේවගේ තැන්වල'' ටයි මහත්තයා කිසිම පැකිලීමකින් තොරව ගුවන් විදුලි ප්‍රධානියා ආමන්ත්‍රනය කලේය.

සර්...අපේ උදවිය වැඩමග දාලා ඇවිත් මොනවද කරන්නේ කියලා බලන්න ආවේ. ගුවන් විදුලි ප්‍රධානියාගේ පිලිතුර වුනි. ඔහු එසේ කියාගෙන යන අතරතුරේ ටයි මහත්තයා සුරේගේ කනට කර යමක් පැවසුවේය.

මෙවැන්නක් අදටද මගේ සිතේ සටහන්වුනිද අතිශය පෞද්ගලික වූ කාරණා පුවත්පතකින් කීමට අවශ්‍ය නොවේ යැයි සිතමි.

මේ දවස් ගැන සිතනවිට පැයතුනක පමන චිත්‍රපටියක් මෙනි. නළුවන්,ගායකයන්,වාදක-යන් ටයි මහත්තයා හා සුරේ වටා රැඳෙනු දුටිමි. ඔවුනොවුන් කිහිප දෙනෙක්ම මාද හඳුනාගතිමි
රාත්‍රිය තුරුණු වන යාමයේ මාත් මගේ හිතවතාත් අවන්හලෙන් සමුගෙන ගෙවල් දොරවල් බලායන්නට රථගාල වෙත පැමිනියෙමු.

වෙලාවේ හැටියට කාර්යාලයෙන් ආ රථය කාර්යාලයට ගොස්ය. එය යන බවක් දැනුම් දුන්නද සුරේට මතක නැත. තව පැයක් හෝ දෙකක් කුලී රථයක් එනතුරු සිටින්නට වෙනවාය.සුරේ ත්‍රීවිල්වල යන්නට කැමති නැත. ''නගින්න බයික් එකට මම ගිහින් දාන්නම්'' මම කීවෙමි. ආශ්චර්යකි. කවදාවත් යතුරුරු පැදියකට ගොඩ නොවූ අපූරු හිතවතා කියූ සැනින් මාගෙ යතුරු පැදියට ගොඩවී මගේ බඩ වැරෙන් මිරිකා අල්ලාගත්තේය.
"හරි යමු.දන්නවනේ ගෙදරට යන විදිහ" මා අශ්වයා වෙනදාටත් වඩා වේගයෙන් එලෙව්වෙමි.අද දවසේ වූ සතුට යතුරු පැදියකටත් වඩා ඉතිරියෙන් ගමන් කරනු යැයි මට දැනේ.මොරටුවේ ලක්ෂපතියේ හිතවතාගෙ නිවසට ගොස් නිරුපද්‍රිතව ඇරලූ මා ඒ ආසන්නයේම වෙසෙන මගේ නිවස වෙත ආමි.එදා මනට වඩා හිත සතුටි-න් මත් වී ඇති බව මගෙ හැඟේ.

දින දෙකකට පසු හිතවතා වෙනද-ාට වඩා සතුටු මුහුණින් මුණගැසේ."අයියේ මාර සනීපයක්නේ දැනුනේ...හුලං පාර කපාගෙන යනකොට අප්පා...අනික ඔය කෙහෙම්මලේ මම ගිහින් නෑනෙ..තමුසෙ එහෙනම් ඒකත් මට පුරුදු කරා." මට සියුම් සතුටක් ගෙනදේ. අදටද මට ඔහුගේ ගතිපැවතුම් හිතවිත්කම් තක්වේ. සුරේ.. ඩබ්.ජී.සුරේන්ද්‍ර නම් වූ ප්‍රවීනයා හදිසි හෘදයාබාධයකින් සමුගත්තද තවමත් ජීවමනාව මනසේ රැඳෙයි..



**සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.**

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au